# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2142/77 - 2019 සැප්තැම්බර් මස 27 වැනි සිකුරාදා - 2019.09.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 05/2019 දරන සුරාබදු නිවේදනය

සුරාබදු ආඥාපනතේ (52 වැනි අධිකාරය වූ) 4, 13 සහ 17 වන වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, මංගල සමරවීර වන මම, 2019 සැප්තැම්බර් මස 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි,

(1) මුළු දිවයිනටම බලපවත්වන පරිදි, විදේශ මත්පැන් සිල්ලරට විකිණිය යුතු උපරිම සීමාව තොග ලීටර් 80 (අසූවක්) ක් විය යුතු බව, සහ

(2) එකී ආඥාපනතට අනුව නිකුත් කරන ලද අවසර පත්‍රයක් මත හැර මුළු දිවයිනටම බල පවත්වන පරිදි සද්භාවයෙන් යුතුව පෞද්ගලික පරිභෝජනය සහ භාවිතය සඳහා විදේශ මත්පැන් ප්‍රවාහනය සහ ළඟ තබා ගැනීම කළ යුතු උපරිම සීමාව තොග ලීටර් 80 (අසූවක්) විය යුතු බව,

මෙයින් නියම කරමි.

2015 දෙසැම්බර් 31 වන දිනැති අංක 1947/41 දරන *අති විශේෂ* ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අංක 985 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

**මංගල සමරවීර,**
මුදල් අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

10 - 510


1A - PG 4659 - 592 (2019/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.